# ප්‍රවීණයෝ මට ආදරෙයි....

-බුවිනි චාපා



**බුවිනි නිළියක් වෙන්න හේතුව අක්කාද?**

ඇත්තටම ඔව්, මගේ අක්කා වත්සලා දියලගොඩ කියලා අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. හැමෝම දන්නවනෙ. අක්කගෙයි මගෙයි ෆොටෝ එකක් පත්තරේක කවරයක් විදියට ගියාට පස්සෙ තමයි මට රඟපාන්න ආරාධනා ලැබුනෙ.

**බුවිනි රඟපාන්න එනවට අක්කා කැමති වුනාද?**

අනේ ඇයි අක්කා අකමැති වෙන්නෙ, මට ලැබෙන චරිත ගැන මං අදටත් අක්කා එක්ක කතා කරනවා, මං රඟපානවට අක්කා කැමතියි.

**නවකයෙක් විදියට ක්ෂේත්‍රයට එනකොට ප්‍රවීණයන්ගෙන් ලැබෙන පිළිගැනීම කොහොමද?**

ඇත්තටම හැම ප්‍රවීණයෙක්ගෙන්ම ලැබුනෙ ගුරුහරුකම්, ඒ අතින් මං වාසනාවන්තයි.

**සමහරුන්ට ප්‍රවීණයන්ගෙන් වෙනස්කම්, හිත් රිදුම් ලැබෙනවා කියලා තියෙනවනෙ?**

ඒ ගැන නම් මං දන්නෙ නැහැ, එහෙම වෙන අයට එයාලගෙ හැසිරීමත් බලපානවා ඇති. මට නම් කිසිම කෙනෙක්ගෙන් වෙනස්කමක් විඳින්න ලැබිලා නැහැ.



**මෙතෙක් ලැබුන චරිත ගැන තෘප්තිමත් ද?**

ඔව්, මේ කෙටි කාලය තුළ විවිධ චරිත රඟපාන්න මට ලැබුනා. ඒ ගැන හුඟාක් තෘප්තිමත්.

**රඟපෑම කියන්නේ තරුණියකට සුදුසු වෘත්තියක් නෙවෙයි කියලා සමහරු කියනවා?**

වැරදි කරන්නේ රඟපාන අය විතරක්ම නෙවෙයි, ඒත් නළු නිළියෝ සමාජයේ වැඩි දෙනෙක් දන්න නිසා එයාලා කරන කියන දේවල් වැඩිපුර කතාබහට ලක් වෙනවා. තරුණියක් මොන වෘත්තියක යෙදුනත්, තමන් දැනගන්න ඕන තමන්ගේ ආත්ම ගරුත්වය රැකගන්න.

**මේ දිනවල කාර්යබහුලද?**

ටිකක් විතර. උතුම් පැතුම්, අංකල් සෑම් කියන නාට්‍යවල රූගත කිරීම් කෙරෙනවනෙ. නව නාට්‍ය කීපයකටම ආරාධනා ලැබිලත් තියෙනවා.



**ගෙදර ඉන්න දවස්වලට රෑ 9.30 ඉඳලා 10 වෙනකල් අවට සිදුවෙන කිසිදෙයක් ගැන අවධානයක් නැහැ කියලා ආරංචියක් තියෙනවා. ඇයි ඒ?**

(සිනාසෙමින්) මේ ආදරයයි බලන නිසා.

**'ආදරය' දකින්නේ මොන විදියටද?**

ජීවිතයට අත්‍යවශ්‍යම දෙයක් විදිහට.

**හෙට දවස ගැන බලාපොරොත්තු මොනවාද?**

මේ කරන කටයුතු හොඳින් කරගෙන ජීවිතේ සාර්ථක කරගන්න එක තමයි.

සඳගෝමි නයනජිත්

# අයිෂ්වර්යාට පසුතැවීමක් නැහැයිලු.



තම දියණිය ආරාධනා නිසා කෙටි කලක් සිනමාවෙන් ඈත්වෙලා හිටපු ඇෂ් ආයෙම සිනමාවට එන්නෙ වසර 5කට පස්සෙ. ඒ මේ දිනවල සාර්ථකව තිරගත වන Jassba චිත්‍රපටයෙන්. නුදුරු දිනයක තිරගත වෙන්න නියමිත,බජිරාඕ මස්තානි සඳහා මුලින්ම ආරාධනා ලැබුනේ ඇෂ්ට, එහෙත් ඇය එය ප්‍රතික්ෂේප කරලා.

බජිරාඕ මස්තානි' සඳහා එහි නිර්මාණකරු සංජේ ලීලා බන්සාලිට ඕන වුනේ අයිෂ්වර්යා සහ සල්මන්ව ගන්න.

'මම ඒ චරිතය ප්‍රතික්ෂේප කළ එක ගැන පසුතැවීමක් නැහැ. හැම චිත්‍රපටයකටම ගැලපෙන යුවලක් ඉන්නවා ඒකටම විශේෂිත සිදුවීම් පෙළක් තියෙනවා. ඒවා වෙනස් වුනොත් චිත්‍රපටය සාර්ථක වෙන්නෙ නැහැ. ප්‍රතික්ෂේප කිරීම ගැන ඇෂ් පවසන්නෙ එහෙම.

පසුව ඒ චිත්‍රපටයට රන්වීර් සිං සහ දීපිකා පදුකෝන් එකතු කරගත්තා.

# 'පුලි' සාර්ථකයි



මේ දිනවල ලංකාවේ අති දැවැන්ත දමිළ චිත්‍රපටයක් ප්‍රදර්ශනය වෙනවා. ඒ 'පුලි' චිත්‍රපටය.

ඉන්දීය රුපියල් කෝටි 118ක් වියදම් කර ඇති මෙහි, දමිළ සුපිරි නළු විජය, ශ්‍රීදේවි, ශෘති හසන්, ඇතුළු ජනප්‍රිය ශිල්පීන් රඟනවා.

'පුලි' හි සිංහල තේරුම කොටියා යන්නයි. මෙම චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක පටයටද විශාල රසික ප්‍රතිචාරයක්ද ලැබී තිබුනා.

මනඃකල්පිත ත්‍රාසජනක කතාවක් වන 'පුලි' හි විජය ද්විත්ව චරිතයක් රඟයි.